# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2019 අංක 15 දරන
## ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 සැප්තැම්බර් මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 ඔක්තෝබර් මස 04 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 අංක 15 දරන**
**ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2019 සැප්තැම්බර් මස 30 වන දින]

එල්.ඩී.— ඕ. 42/2013

**1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1998 අංක 12 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) මණ්ඩලය පහත දැක්වෙන —

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම් —

(i) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්;

(ii) කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගෙන්;

(iii) ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාගෙන්;

(ආ) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මුදල් අමාත්‍යාංශයේ එක් නියෝජිතයකුගෙන්; සහ

(ඇ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් හතර දෙනෙකුගෙන්,

සමන්විත විය යුතු ය.".

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) මණ්ඩලයේ නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයකු ම තමා මණ්ඩලයේ සාමාජිකයකු වී ඇත්තේ යම් ධුරයක් දැරීම ප්‍රකාරව ද ඒ ධුරය දරන තාක් කල් මණ්ඩලයේ සාමාජික ධුරය දැරිය යුතු ය."; සහ

(3) එහි (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "සාමාජිකයන් තිදෙනෙකු" යන වචන වෙනුවට "සාමාජිකයන් පස් දෙනෙකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (අ) ඡේදයේ "සේවා නියුක්තයන්ගේ" යන වචන වෙනුවට "සේවා නියුක්තයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයේ "සේවා නියුක්තයන්ට" යන වචන වෙනුවට "සේවා නියුක්තයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(උ) (i) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම සඳහා;

(ii) මේ ඡේදය යටතේ සපයනු ලබන මූල්‍යමය සහන, මේ පනත යටතේ තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, සෑම ලොතරැයි පතක ම මුහුණතෙහි "ශ්‍රම වාසනා" යන යෙදුම අන්තර්ගත කරන ලද ලොතරැයියක් පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම;" සහ

(2) එහි (2) වන උපවගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:—

"(එඅ) අරමුදලේ කාර්ය සඳහා පවත්වාගෙන යනු ලබන ලොතරැයි දියුණු කිරීමට හා ප්‍රචාරණය කිරීමට; සහ".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) එම සෑම ලොතරැයියක ම එක් එක් ටිකට් පතෙහි මුහුණතෙහි "ශ්‍රම වාසනා" යන යෙදුම අන්තර්ගත විය යුතු අතර අරමුදල සහ ලොතරැයි මණ්ඩලය එකඟවන ආකාරයකින් පැවැත්විය යුතු ය."; සහ

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2අ) අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇතිකර ගන්නා එකඟවීමට, වෙනත් කරුණු අතර —

(අ) එසේ පවත්වන ලොතරැයිවල දී ප්‍රදානය කරන තෑගි පිළිබඳව;

(ආ) ඒ ලොතරැයිවල දී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව; සහ

(ඇ) ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව,

විධිවිධාන ඇතුළත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියෙහි "අවශ්‍ය යයි මණ්ඩලය සලකන රීති" යන වචන වෙනුවට, "අවශ්‍ය යයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මඟින් රීති සෑදීමේ බලය දී ඇති හෝ රීති සෑදීම අවශ්‍ය යයි සලකන කාරණා සඳහා රීති" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:—

"(2) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළකරන ලද දිනයෙහි සිට හෝ ඒ රීතියෙහි නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම, එය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබීමෙන් පසු මාස හයක් ගතවීමට පෙර, අනුමතය

සඳහා පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන ආ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) ඒ අනනුමතයේ දිනය පිළිබඳ වන නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ "පළාත් පාලන ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

" "අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ;".

**8.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.